# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2025 වර්ෂයේ **ඔක්තෝබර්** මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරු පුරප්පාඩු **600** ක් සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් දිස්ත්‍රික් පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our services " යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ජූලි මස 28** වැනි දින පෙ.ව.**9.00**ට විවෘත වන අතර **2025 අගෝස්තු මස 15** වැනි දින **රාත්‍රී 9.00**ට අවසන් වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

2. *භාෂා මාධ්‍ය* **: විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොලැබේ.**

*3. බඳවා ගැනීමේ සුදුසුකම්* :

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය යන විෂයයන්ට සම්මාන සහිතව සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ සමග එක් වරක දී විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙ.) සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස (උ.පෙ.) විභාගයෙන් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

පරිගණක වදන් සාක්ෂරතාව පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයක පැය 360 කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කළ බවට සහතිකයක් ලබා තිබීම.

***සටහන*** :- ඔබ හදාරා ඇති පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයක් හා පාඨමාලාවක් ද යන වග www.tvec.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් තහවුරු කරගත හැකිය.

(ඇ) කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(ඈ) වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්තවන බවට ග්‍රාම නිලධාරී විසින් සනාථ කළ යුතුය.
iii. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.
iv. 2025.08.15 වැනි දිනට ඉහත 3 (අ) සහ (ආ) හි දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඉ) මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය.

(ඊ) දිස්ත්‍රික් මට්ටමින් තනතුරු පුරප්පාඩු 600 සඳහා බඳවා ගන්නා ආකාරය පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 204 |
| ගම්පහ | 42 |
| කළුතර | 27 |
| මහනුවර | 60 |
| මාතලේ | 11 |
| නුවරඑළිය | 15 |
| ගාල්ල | 21 |
| හම්බන්තොට | 10 |
| මාතර | 11 |
| යාපනය | 8 |
| කිලිනොච්චි | 1 |
| මන්නාරම | 3 |
| මුලතිව් | 1 |
| වවුනියාව | 2 |
| අම්පාර | 11 |
| මඩකලපුව | 12 |
| ත්‍රිකුණාමලය | 5 |
| කුරුණෑගල | 30 |
| පුත්තලම | 18 |
| අනුරාධපුරය | 17 |
| පොළොන්නරුව | 09 |
| බදුල්ල | 28 |
| මොනරාගල | 11 |
| කෑගල්ල | 18 |
| රත්නපුර | 25 |
| **එකතුව** | **600** |

(උ) දිස්ත්‍රික්කයකට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :

දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතුරින් එකක් හෝ සපුරා තිබිය යුතුයි.

(i) අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයකු වීම; හෝ
විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු 5ක් ඇතුළත එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසයෙන් අවුරුදු 03 ක්වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටින අයෙකු විය යුතුය, හෝ

(ii) ඔහු/ඇය නොකඩවා අවුරුදු 5ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීය පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.

සටහන-

(i) යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ.

(ii) කිසියම් අපේක්ෂකයකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරා ගත් පසු එය නැවත වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**4. විභාග මධ්‍යස්ථාන :**

- පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් විභාගය පැවැත්වේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරනු ලබන නගරය හා නගර අංකය මෙහි සඳහන් පරිදිම නිවැරදිව අයදුම්පතේ සඳහන් කළ යුතු අතර ඉල්ලුම් කරනු ලබන නගරය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

- අයදුම්පතෙහි තම මනාපය අනුව නගර දෙකක් නම් කළ හැකි වන අතර විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් එම අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත.

- තව ද අනෙකුත් නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්පත් ඉදිරිපත් වී නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

විභාග මධ්‍යස්ථාන :

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික්/ නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |

| *දිස්ත්‍රික්කය/ නගරය* | *දිස්ත්‍රික්/ නගර අංකය* |
|---|---|
| කිලිනොච්චි | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

**5. බඳවා ගැනීමේ ක්‍රමය :**

(i) දිස්ත්‍රික් මට්ටමින් අයදුම්පත් කැඳවා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකින් ම සමත්වන අයදුම්කරුවන්, එම පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙළ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (සේවා අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ස්ථානමාරු කිරීමේ කොන්දේසියට යටත්ව)

(ii) එක් දිස්ත්‍රික්කයක සියලුම පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය අයත් පළාතේ අනෙකුත් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගෙන් ලබා ඇති මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කරනු ලැබේ.

(iii) ඉහත i හා ii අනුව සම්පූර්ණ කළ නොහැකි පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී නම් එම පුරප්පාඩු සංඛ්‍යාව සියලුම අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව දිස්ත්‍රික් පදනම නොසලකා සම්පූර්ණ කරනු ලැබේ.

❖ දිස්ත්‍රික් පදනමින් බඳවා ගනු ලබන නිලධාරියකු සුදුසුකම් ලැබූ දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු ලැබීම සඳහා සුදුසුකම් ලබනු නොලැබේ.

❖ එලෙස වුව ද සේවා අවශ්‍යතාව මත සහ සුවිශේෂී අවස්ථාවල දී පත්වීම් බලධරයාට ඉහත සඳහන් කොන්දේසි නොසලකා දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කළ හැකිය.

**6. වයස :**

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2007.08.15 දිනට හෝ ඊට පෙර හා 1995.08.15 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)**

**7.** **වැටුප් පරිමාණය :**
**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ට අනුව මාසික වැටුප් පරිමාණය (PSO 2 - 2025)**

**රු. 54,650 - 10 X 800 - 10 X 1,190 වේ. (උපරිමයක් නැත)**

**8.** **අයදුම් කිරීමේ ක්‍රමය :**

(අ) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E - mail ) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

(ඇ) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ හා සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**9.** **විභාග ගාස්තු ගෙවීම :**

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් ( Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank Of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank Of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**10.** **ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන , අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා මාර්ගගතව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වේතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

**11. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එතකුදු වුවත් තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරින් යටත් විය යුතු වේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වනවිට රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක ස්ථිර කර නොසිටී නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදාළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීම් කාලයකට යටත් වනු ඇත.

**12. විභාග ක්‍රමය:**

**මෙම විභාගය පහත සඳහන් පරිදි වන ලිඛිත ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.**

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | පැය 01 ½ | 100 | 40% |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රයට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ. අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම, භාෂා අවබෝධය, අක්ෂර වින්‍යාසය හා සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ හැකියාව මෙමඟින් මැන බලනු ලැබේ.<br><br>සමානාර්ථ, විරුද්ධාර්ථ පද පිළිබඳ අවබෝධය, භාෂාව භාවිතයේ දී අනුගමනිත උපායමාර්ග පිළිබඳ දැනුම මෙමඟින් මැන බලනු ලැබේ.<br><br>භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුනු පාඨ ආශ්‍රයෙන් පදවල අර්ථය, තනි වාක්‍යයකින් ප්‍රකාශ කිරීම, ඒ පිළිබඳව විවරණාත්මක සටහන් ලියා දැක්වීම, විකල්ප කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දැක්වීම, පිළිතුරු කීහිපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දැක්වීම.<br><br>ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානවලට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොටගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය සංඛ්‍යාමය කුසලතාව, ගණිත ගැටලු, සාමාන්‍ය දැනුම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවිධ ප්‍රශ්න පත්‍රයකි. |

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

**13. තෝරාගැනීමේ ක්‍රමය :**

(අ) මෙම තනතුරු සඳහා ඉහත 03 ඡේදයේ දක්වා ඇති සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහාවන සම්මුඛ පරීක්ෂණයකින් පසු සුදුස්සන් තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.)

(ආ) විභාග ප්‍රතිඵල මත දිස්ත්‍රික් කුසලතාව අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

(ඇ) ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව සකසන ලද ප්‍රමුඛතා ලේඛනයේ දිස්ත්‍රික් කුසලතාව අනුව වැඩිම ලකුණු ලැබූ අයදුම්කරුගේ සිට අනුපිළිවෙළින් එක් එක් දිස්ත්‍රික්කයේ පිරවීමට නියමිත පුරප්පාඩු ගණන සඳහා පත්වීම් පිරිනැමීම සඳහා අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(ඉ) ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අපේක්ෂකයන්ගේ මුළු ලකුණු දිස්ත්‍රික් කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම හෝ කෙරෙනු ඇත.

14. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයකු විසින්ද ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම තැපැල්පති සතු වන්නේ ය.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

| | |
|---|---|
| වමීෂා ද සිල්වා<br>නියෝජ්‍ය තැපැල්පති (පාලන) | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර<br>තැපැල්පති |

07-811